**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

**(පරිසර අමාත්‍යාංශය)**

# අම්පාර දිස්ත්‍රික් කාර්යාල පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් බදු කුලී පදනම මත ලබා ගැනීම.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය සඳහා පහත සඳහන් අවශ්‍යතා අනුව අම්පාර දිස්ත්‍රික්කයෙන් බදු හෝ කුලී පදනම මත නිවසක් හෝ ගොඩනැගිලක් අවශ්‍ය වේ.

1. වෙරළබඩ ප්‍රදේශවලට ආසන්නව පිහිටා තිබිය යුතු අතර අක්කරෙයිපත්තු ප්‍රදේශයේ වඩාත් සුදුසුය.

2. වර්ග අඩි 2000 ක ඉඩ ප්‍රමාණයක්, ප්‍රධාන මාර්ගයට මුහුණලා හෝ ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 50 ක් ඇතුලත පුළුල් ප්‍රවේශ මාර්ගයක් සහිත විය යුතුය. අවම වශයෙන් වාහන 02 ක් සඳහා වාහන නැවැත්වීමේ ඉඩක් තිබිය යුතුය. ජලය විදුලිය සහ දුරකථන පහසුකම් තිබිය යුතුය.

3. ඉඩම වටා පැරපෙට් මායිම් බිත්ති/වටකුරු වැටක් තිබිය යුතුය.

4. කාර්යාල අවකාශයට අමතරව , බාහිර කාර්ය මණ්ඩල නවාතැන් සඳහා අමතර කාමර 2 ක් තිබිය යුතුය.

5. බදු හෝ කුලී පදනම මත අවම වශයෙන් අවුරුදු 03ක කාලයක් සඳහා ලබා ගත හැකි විය යුතුය.

**සැලකිය යුතුයි - ඉහත සඳහන් කල 01 සිට 05 දක්වා කොන්දේසි වලට අමතරව පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- අදාළ නිවස හෝ ගොඩනැගිල්ල බදු දීමට හෝ කුලියට දීමට නීත්‍යානුකූල අයිතිය සනාථ කිරීම සඳහා ලේඛණයේ පිටපතක්.
- අදාළ පළාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපතක්.
- බදු දීම සඳහා දේපළ සඳහා රජයේ තක්සේරු සහතිකයේ පිටපතක්.

උනන්දුව දක්වන ලංසු කරුවන් යෝජනා/විස්තර (ඡායාරූප සහිතව) ඇතුළුව මිල ගණන් **2026.07.03** දින පස්වරු 2.00 ට පෙර "සභාපති-ප්‍රසම්පාදන කමිටුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක - 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ - 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් පාලන අංශයෙහි ටෙන්ඩර් පෙට්ටියට දැමීම සිදුකල යුතුය.

අසම්පූර්ණ අයදුම්පත්, ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත්, ෆැක්ස්, විද්‍යුත් තැපෑලෙන් හෝ සාමාන්‍ය තැපෑලෙන් යොමු කරන ලද අයදුම්පත් ලංසු ඇගයීමෙන් ඉවත් කරන ලැබේ.

ඉදිරිපත් කරනු ලබන මිල ගණන් බහාලනු ලබන කවරයෙහි ඉහල වම් කෙළවරේ "කාර්යාල පහසුකම් බදු හෝ කුලී පදනම මත ලබා ගැනීම - අම්පාර දිස්ත්‍රික්කය" ලෙස සටහන් කල යුතුය.

මේ සම්බන්ධයෙන් යම් විමසීමක් වෙතොත් 0112-554624 යන අංකය ඔස්සේ පරිපාලන නිළධාරි සම්බන්ධ කර ගන්නා මෙන් ඉල්ලා සිටිමි.

සභාපති

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරය

අංක-177, නාවළ පාර,

නාරාහේන්පිට, කොළඹ - 05.

18/6/26

සමන්ත ගුණසේකර
MSc. (Spain), BSc. (SL), FGG. (Ger.), FGA (G.B)
සභාපති
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
පරිසර අමාත්‍යාංශය